# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/8 – 2021 නොවැම්බර් මස 23 වැනි අඟහරුවාදා – 2021.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ නියමය

1. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩය සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2021 නොවැම්බර් මස 24 දින සිට ආරම්භ වන මාස 06ක් දක්වා වූ කාල සීමාවක් සඳහා වලංගුව පැවතිය යුතු ය.

*උපලේඛනය*

| *1 වන තීරය* | | | | *11 වන තීරය* |
|---|---|---|---|---|
| **වෙළෙඳ භාණ්ඩය** | | | | **විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද** |
| | **සං. ව. ශීර්ෂය** | **සං. ව. සංකේතය** | **විස්තරය** | |
| 1 | 08.01 | 0801.11.90 | දිසිදි පොල් - අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 300 |

2. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දිසිදි පොල් - අනෙකුත් (රේගු සංකේතාංක 0801.11.90) සඳහා, 2021 නොවැම්බර් මස 24 දින සිට ආරම්භ වන මාස 06ක් වූ කාල සීමාවක් තුළදී, කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශය මත, රජයට අයත් බී. සී. සී. ලංකා ලිමිටඩ් ආයතනය වෙත පමණක් ආනයනය කිරීමට සහ ඒ සඳහා අදාළවන කිලෝ ග්‍රෑමයකට රු. 300ක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 1 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

බැසිල් රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 120

1A – PG5622 – 485 (2021/11)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*